**සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

### (අ) ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | --------------------- |
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු. 843,353 ක් මුදල මූල්‍ය ප්‍රකාශනවල ගබඩා භාණ්ඩ වශයෙන් නොදක්වා විදුලි ණයගැති වශයෙන් දක්වා තිබුණු අතර, විදුලි ණයගැති ශේෂය වන රු. 229,705 ක් ගිණුම්වලින් අත්හැරි තිබුණි. | අදාල වියදම් අදාල ගිණුම් යටතේ අත්හැරීම්වලින් තොරව දැක්විය යුතු වේ. | ගිණුම් තැබීමේ දෝෂයකි. ඉදිරියේදී නිවැරදි ශීර්ෂය යටතේ ගිණුම් තබන බව දන්වා සිටිමි. |
| (ii) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මණ්ඩල වාර්තාව අනුව 2017 සහ 2018 වර්ෂවල වෙන්දේසි කරන ලද සහ විනාශ කරන ලද ගෘහ භාණ්ඩ, උපකරණ සහ පුස්තකාල පොත්වල පිරිවැය ගිණුම්වලින් කපා හැර නොතිබුණි. | අදාල පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී පිරිවැය ගිණුම්වලින් ගැලපුම් කරන බව දන්වා සිටිමි. |
| (iii) | ඒෂියා ෆවුන්ඩේෂන්, ප්‍රජා ආයතන සහ වෙනත් පුද්ගලයන් විසින් 2017 වර්ෂයේ සභා පුස්තකාලවලට පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ පොත් 672 ක වටිනාකම රු. 476,155 ක් ගිණුම් ගතකර නොතිබුණි. | අදාල පොත්වල වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | අදාල පොත්වල වටිනාකම ඉදිරියේදී ගිණුම්ගත කර නිවැරදි කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2014 සහ 2015 වර්ෂවල ප්‍රාදේශීය සභාවට ලබාදුන් වාහන 5 ක වටිනාකම අමාත්‍යාංශයෙන් දැනුම් දී තිබූ පරිදි රු. 61,003,982 ක් ලෙස දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 57,695,000 ක් ලෙස පෙන්වා තිබීමෙන් රු. 3,308,982 කින් ස්ථාවර වත්කම් සහ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශයෙන් දැනුම්දුන් පරිදි වෙළඳ පොල වටිනාකම ගිණුම්වල සටහන් කළ යුතු වේ. | ලිපිය සඳහන් පරිදි ඉදිරියේදි ගැලපීම් කරන බව දැනුම් දෙමි. |

(ආ) නොසැසඳූ ගිණුම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව වරිපනම් බදු ශේෂය සහ අදාල උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂ අතර පහත පරිදි වෙනස්කම් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසදා ගිණුම්වල ගැලපීම් කිරිමට කටයුතු කළ යුතු වේ. | අදාල වෙනස නව දේපලවල තාවකාලික තක්සේරු අයකිරීම් අනුවද දඩ මුදල් අයකිරීම් අනුවද වෙනස්කම් ඇතිවිය හැකිබව දැනුම් දෙමි. |

| වරිපනම් බදු අයවීම | මූල්‍ය ප්‍රකාශන අනුව | වරිපනම්බදු ලේඛන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2018.01.01 ශේෂය | 13,405,363 | 19,362,697 | 5,957,334 |
| බිල්කළ ආදායම් | 4,329,858 | 5,316,457 | 986,599 |
| 2018.12.31 ශේෂය | 14,422,133 | 21,366,064 | 6,943,931 |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති විම.**

**-------------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ වාර්තා, තොග ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 29,811,585 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති<br>පරිච්ඡේදය X වගන්තිය 193 | සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ තොරතුරු අයවැය සමඟ සසඳා වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම ඇතුලත් ප්‍රකාශයක් පිළියෙලකර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | ප්‍රකාශයන් අදාල කාලවල පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල ක්‍රියාවලිය මෙතෙක් අනුගමනය කර නොතිබුණි. 2019 අයවැය විචලනය සඳහන් පැහැදිලි කිරීම ඇතුලත් ප්‍රකාශයක් පිළියෙල කර ඉදිපත්කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු. 3,543,490 ක් වටිනා වර්ෂ දෙකක් ඉක්මවූ කල් ඉකුත්වූ තැන්පත් 229 ක් සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | අදාල තැන්පත් කරුවන්ගෙන් විශාල ප්‍රමාණයන්ගේ ලිපිනයන්, සම්බන්ධ අදාල විස්තර නොමැතිවීමෙන් ප්‍රමාදවිය. මේවා සොයාබලා අවශ්‍ය කටයුතු කිරීමට අවශ්‍ය පියවර ආරම්භ කර ඇත. |

## 1.4.2 බදු අවශ්‍යතාවන්හට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 260,154 ක වැට් බදු 2017 වර්ෂයේදී අයකර තිබුණද, දේශිය ආදායම් දෙපාර්තමෙන්තුවට ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාල දෙපාර්තමෙන්තුවට අදාල කාල පරිච්ඡේදයේ දී යැවීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් ගිණුමේ දක්වා ඇති වැට්බදු නැවත ගෙවීමට කටයුතු කර ඇති බව දන්වා සිටමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,943,411 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,855,743 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,907,719 | 4,329,859 | 3,313,089 | 14,422,133 | 3,888,000 | 3,901,892 | 2,246,000 | 13,405,364 |
| කුලී | 20,271,858 | 20,361,397 | 20,873,137 | 8,478,021 | 19,292,000 | 19,008,129 | 19,670,000 | 8,989,761 |
| බලපත්‍ර ගාස්තු | 1,300,000 | 1,408,166 | 1,408,166 | - | 900,000 | 1,231,500 | 1,231,000 | - |
| වෙනත් ආදායම් | 20,640,000 | 22,315,754 | 22,315,754 | - | 18,153,000 | 17,077,927 | 17,078,000 | - |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. 70,810,301 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 47,910,146 ක් අකයර ගෙන තිබුණි. මේ අනුව ආදායම් අයවිමේ ප්‍රගතිය සියයට 60 % ක් විය. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල සමග සමාලෝචිත වර්ෂයේ ආදායම් ද අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 අප්‍රේල් 26 වන දිනැති 1,808 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍ර දැන්වීම අනුව, සභා බල ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරි වසම් 22 ක් තව දේපළ තක්සේරු කිරීම සඳහා ප්‍රකාශයට පත්කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මේ දේපල තක්සේරු කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. මේ හේතුවෙන් අදාල ග්‍රාම සේවා වසම් වලින් අයකර ගත හැකිව තිබු වරිපනම් බදු ආදායම් අහිමිකර ගෙන තිබුණි. | අදාල තක්සේරුව ලබාගෙන වරිපනම් බදු අයකිරීම කටයුතු කළ යුතු වේ. | සමන්තුරේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශියේ තිබෙන ග්‍රාමසේවා නිලධාරි වසම් 22 ක තක්සේරු කළයුතු දේපල සංඛ්‍යාව 16,859 ක් තිබෙන අතර එවා තක්සේරු කර දෙනමෙන් දිස්ත්‍රික් තක්සේරු කාර්යාලයට සභාපතිතුමා කීප වතාවක් ගොස් ඉල්ලීම් කළ නිසා මෙම මස අගදි තක්සේරු කිරීම සඳහා නිලධාරින් එවන බව දිස්ත්‍රික් තක්සේරුකර පවසා ඇත. එම තක්සේරු වාර්තා ලද විගස අදාල බදු මුදල් අයකරනු ලැබේ. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමන්තුරෙයි පොදු වෙළඳපොලහි තිබෙන කඩ කාමර 88 ක් 2018 වර්ෂයේදී බදු දී තිබුණද, 2003 වර්ෂයෙන් පසු ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් අළුත් කිරීමට හෝ අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල කඩ කාමර සඳහා ගිවිසුම් බදුවලට අදාල තක්සේරු කිරීමේ ක්‍රියාවලිය නිසා ප්‍රමාදවී ඇත. දැනට තක්සේරු දෙපාර්තමෙන්තුවේ නිලධාරින් ක්ෂේත්‍රයට පැමිණි විස්තර රැස්කෙරෙමින් පවතින අතර තක්සේරු වාර්තා ලද විගස නව ගිවිසුම් අත්සන්කර නව කඩ කුලිය අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii) (ඊ) වන වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ 35 කට වඩා වැඩි දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකිරීම 2019 මැයි 30 වන දින දක්වා කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල ව්‍යාපාරික ආයතනවලින් ලිඛිතව දැනුම් දී තිබුණද, එම ආයතන මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවන බව සඳහන් කරමින් ගාස්තු ගෙවා නොතිබුණි. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සහ 126 වගන්ති අනුව ව්‍යාපාර ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙන මෙම ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක පුවරු සවිකිරීම සඳහා ආධාරක ගොඩනැගිලි ඉදිකර දැන්වීම් ප්‍රචාර සඳහා අවස්ථා සලසාදී එමගින ප්‍රචාරක ගාස්තු ආදායම් වැඩිකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඩිජිටෙල් ක්‍රමය අනුව අදාල ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීමට සහ මුදල් ආධාර ලබා ගැනීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත්, දේශපාලන වාර්තාවර්ණ පළාත් සභා විසුරුවා හැරීම් යන හේතුවෙන් අදාල කටයුත්ත ප්‍රමාද වී තිබුණි. කෙසේවෙතත් අමාත්‍යංශයකින් මුදල් ආධාර ලබාගෙන මෙම ව්‍යාපෘත්තිය මෙම වසරේදී ක්‍රියාත්මක කරන බව දැනුම් දෙමි. |
| (ඇ) සමන්තුරෙයි පොදු වෙළදෙපොල ඉදිකිරීමේ කටයුතුවලදී ඉඩම් අහිමිවූ පුද්ගලයින් 14 දෙනෙකුට ප්‍රාදේශීය ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රිවරු, දිස්ත්‍රික් ලේකම් ඇතුළුව එළඹූ ගිවිසුම් අනුව කඩ කාමර බදු දී තිබුණි. එසේවූවද, මේ අයගෙන් 2003 ජුලි 08 වන දින ගිවිසුමේ 10 වන කොන්දේසි අනුව පළවූ වර්ෂ 5 කට පසුද ඉන්පසු වර්ෂ 3 කට වරක් ගිවිසුම් සංශෝධනය කළ යුතුබව සඳහන් කර ඇත. එසේවූවද, මෙම ගිවිසුම් වර්ෂ 15 ක් ගතවී තිබුණද, අළුත් කිරීමකින් තොරව පැවතුනි. | ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල පොළ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් බදු ගත් අය හිඟ මුදල ගෙවීම ප්‍රතික්ෂේප කිරති. ඒ අයට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීම ආරම්භකර ඇත. කඩ කාමර දැනට අපවිසින් වසා දමා ඇත. අළුත්වැඩියා කිරීම් සිදුකිරීමෙන් පසු අළුතෙන් මිළගනන් කැදවා කඩ කාමර බදු දීමට කටයුතු කර ඇත. |

### 2.2.6 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂය දක්වා බදු දී තිබූ මස් කඩ වලින් අයවිය යුතු රු. 1,751,340 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල් සමග සමාලෝචිත වර්ෂයේ අදායම් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මෙතෙක් මස්කඩ බදු මුදල නොගෙවූ අයට එරෙහිව නඩු පවරා ඇත. නඩු තීන්දු අනුව අනෙක් බදු කරුවන්ට විරුද්ධව කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මස්කඩ බදුකරුවන් තම බදු මුදල් ප්‍රමාදව ගෙවීම හෝ නොගෙවන අවස්ථාවේදී අයකළයුතු දඩ මුදල සහ නීතියානුකූලව කටයුතු සම්බන්ධයෙන් ගිවිසුම් කොන්දේසිවල ඇතුලත් කර නොතිබීමෙන් හිඟ මුදල් අයකර ගැනීමේ සම්බන්ධයෙන් සභාවට විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවී ඇත. | බදු ගිවිසුමේ කොන්දේසිය පැහැදිලිව ඇතුලත්කර පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | මස්කඩ බදු කරුවන් බදු මුදල් ප්‍රමාදවී ගෙවීම, දඩ මුදල අයකර ගැනීම, බදු ගිවිසුම්, මිල ගණන් කැඳවීම, අවම මිල තීරණය කිරීම යන සමහර නීතිමය ගැටළු නිරාකරනය කර ගැනීමට නීතිඥයෙකු පත්කිරීමට සභාව විසින් තීරණය කර ඇත. මෙම නිලධාරි මගින් 2020 වර්ෂයේ ගිවිසුම් ලියවිලි පිළියෙලකර ඉහත වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.7 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන නිශ්චල දේපළ හුවමාරු කිරීමේදී නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් 2017 සහ 2018 දෙසැම්බර් මස දක්වා කාල පරිච්ඡේදයතුලදී සෘජුව සහ ජංගම සේවය මගින් අයකරන ලද අතිරේක මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරේක මුද්දර ගාස්තුවලට අදාල ලියවිලි පිළියෙල කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කල්මුණේ ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව 2018 ජනවාරි සිට දෙසැම්බර් මාසවලට අදාල මුද්දර ගාස්තු ලියවිලි ලබා දීම සඳහා ඒවා අදාල ආකෘත්තියේ පිළියෙල කර ඉඩම් රෙජිස්ටාර්ගේ අවධානට යවා ඇත. මෙම ලියවිලි භාරදීමෙන් පසු 2017 වර්ෂයේ අත්හැරුණු හිඟ මුදලට අදාල මුද්දර ගාස්තු ලියවිලි පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුභ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටත්, ප්‍රධාන කාරණා සම්බන්ධයේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 05 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණි. | පනත අනුව ප්‍රධාන අතුරු ව්‍යවස්ථා පනවා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට දිස්ත්‍රික් මට්ටමෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සමඟ සම්බන්ධවී ප්‍රධාන අතුරු ව්‍යවස්ථා සකස්කිරිමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා 06 අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදාල නිලධාරින් සමඟ සම්බන්ධවී මෙම සැලැස්ම ඉදිරියේදී පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පහත සඳහන් ක්‍රියාකාරකම් 3 ක කාර්ය සාධනයේ ප්‍රමාදයක් දක්නට ලදි.<br>(i) Windening and Asphalt Laying for Vandu Vaikkal Road<br>(ii) Construction of Asphalt concrete Laying for Mal 2nd Cross Road.<br>(iii) Construction of Asphalt concrete Surfacing Road and Drainage for Ismailpuram Road. | අදාල ක්‍රියාකාරකම් වල ප්‍රමාදය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන හා ගිවිසුම අනුව කටයුතු කළ යුතු වේ. | අදාල කොන්ත්‍රාත්කරු කර්මාන්තය කඩිනමින් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. මෙම කාර්මාන්තයේ වැඩ මන්දගාමීව කර ගෙනු යන අතර සියළුම කොන්ත්‍රාත් ක්‍රියාවලිය පිරිනැමීමද පලාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ඉටු කරන ලබයි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකුල වන පරිදි සැම පොදු ආයතනයම ක්‍රියා | ඉලක්ක හඳුනාගෙන ඒවා මැණීම සඳහා දර්ශක | තිරසර සංවර්ධන ඉලක්ක 01 අනුව දිළිඳුබව තුරන් කිරීම සඳහා අප විසින් 2018 වර්ෂයේදී කාන්තාවන් 05 දෙනෙකුට රු. 500,000 ක මුදලක් ජීවනෝපාය සඳහා වෙන්කර එය |

| | | |
|---|---|---|
| කළයුතුයි. එසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලබා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ක්‍රියාත්මක කරන ලදි. තවද දිළිඳුබව තුරන් කිරීමේ වැදගත් අංශයක් වන මාර්ග සංවර්ධනය නව මාර්ග ඉදිකිරීම කිරීම සඳහා මුදල් වෙන්කර ක්‍රියාත්මක කර තිබුණි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිලි, මහජන පුස්තකාල, මහජන පොල, මහජන ක්‍රීඩාංගන, පොදු සුසානභූමි, කටු ඇහරුම් මෝල, ළමා උද්‍යාන, ප්‍රජා මධ්‍යස්ථාන සහ සත්ව ඝාතනාගාර යන ස්ථාන පිහිටුවා තිබෙන ඉඩම් 48 ක අයිතිය සභාවේ නමට මාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමකින් තොරව තිබුණි. අදාල කටයුතු ඉදිරියට ගෙන යාමට කටයුතු කර ඇත. |
| (ආ) | 2017 සහ 2018 වර්ෂවල පුද්ගලයන් 08 දෙනෙකුගෙන් අයකර ගෙන තිබු රු. 60,811 ක් සේවක අර්ථසාධක මුදලේ දායක මුදල් පුද්ගලයන් 19 දෙනෙකුගෙන් අයකර තිබූ රු. 411,583 ක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අදාල අරමුදල් වලට නොයවා තැන්පත් කර තිබුණි. | අදාල අයකිරීම් සහ දායක මුදල් අදාල අරමුදල් වලට යැවීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් ගිණුමේ තිබෙන දායක මුදල් අදාල ආයතනවලට යැවීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

### 3.3 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ට්‍රැක්ටර් රථ දෙකක් පිළිවෙලින් 2016 සහ 2017 වර්ෂය සිට අළුත්වැඩියා කිරීමකින් තොරව ගාල්කර තිබුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අබලන් තත්වයේ තිබෙන ට්‍රැක්ටර් රථ දෙකකින් එක් ට්‍රැක්ටර් රථයක් විකිණීම සඳහා නැගෙනහිර පළාත යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත වර්තා යවා ඇති අතර අනෙත් ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රීලංගම ඉංජිනේරුවරයාගෙන් තාක්ෂණ වාර්තාවක් ඉල්ලා ඇත. |

**3.4 ප්‍රසම්පාදන**

**3.4.1 ප්‍රසම්පාදන වැඩ සටහන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ඉදිරි වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් පුහුණු ලැබූ නිලධාරින් ස්ථාන මාරුවී ගොස් ඇති බැවින් එම අයගේ සහයෝගය ලබාගෙන ඉදිරියේදී නිරාකරණය කරන බව දැනුම් දෙමි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබුණි. | අභ්‍යන්තර විගණය අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කාර්යයන් පළාත් පාලන ආයතන වල සේවය කළ පළපුරුදු නිලධාරින් ලවා ඉටුකර ගන්නා ලදී. ස්ථාන මාරුවීම හේතුවෙන් මේ කාර්යයන් කිරීමට නොහැකිව ඇත. අළුතින් ස්ථාන මාරුවීම ලැබී පැමිණි නිලධාරින් ලවා මෙම කාර්යයන් ඉටුකරන බව දන්වා සිටිමි. |

**4.2 නිරවුල් නොවූ විගණන නිරීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 1999 වර්ෂයේ ඉදිකරන ලද සභාවේ හිජ්රා මහජන පොළහි පිහිටි කඩ කාමර 84 ක් බදු දීම සම්බන්ධයෙන් විගණනය වෙත ලැබුණු ලිඛිත ප්‍රකාශය අනුව මෙම පොළට අසල පිහිටි පුද්ගලික කඩ කාමර මාසිකව රු. 6,000 ක් රු. 20,000 ක් අතර පරාසයක් බදු දී තිබුණද, සභාව සතු මෙම කඩකාමර අළුතින් මිල කැඳවීම් නොකර රු. 585 සිට රු.3,335 දක්වා පරාසයකට බදු දීමෙන් වාර්ෂික රු. 2,700,000 ක් පමණ මුදලක් සභාවට අහිමිවී තිබුණි. | කඩ කාමරවල කුලි නැවත තක්සේරු කර බදු ගිවිසුම් අලුත්කර ගිවිසුම් කොන්දේසියවලට අනුකූලව කඩ කාමර බදු දිය යුතු වේ. | අදාල කඩ කාමර තක්සේරු කිරීම සඳහා තක්සේරු නිලධාරින් 2019.02.21 පමණ තක්සේරු කර ඇති අතර, එම වාර්තාව මෙම සතියේ ලබා දෙන බව දන්වා ඇත. මෙම තක්සේරු වාර්තාව ලැබුණු පසු කඩ කාමරවල මාසික කුලි වැඩිකර කුලි අයකර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් නිරවුල් කළයුතු අත්තිකාරම් රු. 6,584,277 ක් සම්බන්ධයෙන් සනාථකළ හැකි ලියවිලි කිසිවක් නොමැතිව සහ මෙම මුදල නිරවුල් කිරිමට කටයුතු නොකර වර්ෂ 14 කට වඩා වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වමින් තිබුණි. | අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට / ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | මෙයට අදාල ලියවිලි නොමැතිවිමෙන් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. අපගේ පරණ කාර්යාලයේ ලියවිලි අතරින් අදාල විස්තර සොයා ගැනිමට කටයුතු කරමි. |